ආයතනයේ නම : වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍ය වරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : வனசீவராதிகள் பாதுகாப்புத் திணைத்தனம்

பாராளுமன்றத்திக் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளைஇலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிகைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution : Department of wildlife Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order NO. 119(4)

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ සභාගත කරන ලද වාර්තා සම්බන්ධ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු නියෝග අංකය - 183

ආයතනයේ නම - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය
පළමු කොටස :73.00	
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම	වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියළු වත්කම් ලේඛන ගත කිරීම (වත්කම්කළමනාකරණ චක්‍රලේඛ අංක 1/2017) යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පිහිටුවා ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු මේ වන විට ලබා දී ඇත.
ලැබෙන වෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම	කොවිඩ් 19 වසංගතය පැවති කාලය තුල වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට නොහැකි වූ අතර මේ වන විට එම ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ අංශ 16 ක් සහ කලාප කාර්යාල 12 ක් ස්ථාපිතව ඇති අතර, විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේදී සමහර අවස්ථාවල මෙම අංශ හා කලාප කාර්යාල වලින් ද තොරතුරු කැඳවිය යුතුවේ. එම තොරතුරු ලබා දීමේ ප්‍රමාදයන් පවතින සමහර අවස්ථාවල මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොලැබෙන අවස්ථා ඇතිවේ. පවතින කොරෝනා වසංගතය හේතුවෙන් නිලධාරීන් සේවයට වාර්තා කිරීමේ සම්භාවිතාව අඩු වීම හේතුවෙන්ද පසුගිය කාල වකවානුවේදී විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොතිබුණි.එහෙත් හැකි සෑම අවස්ථාවකම මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමට උත්සාහ දරන බව දන්වමි
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම	

වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහ ණය ශේෂ පැවතීම	විශ්‍රාම ගිය, මිය ගිය,සේවය හැර ගිය හා වැඩ තහනම් වූ නිලධාරීන් 19 දෙනෙකුගේ හිහ ණය ශේෂ මේ වන විට අයකර ගෙන ඇති අතර, තව දුරටත් අයවිය යුතු ණය ශේෂයන් අය කර ගැනීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් උරුමකරුවන් පිළිබඳව සහ වත්කම් පිළිබඳව තොරතුරු ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගෙන ඇති බව දන්වමි.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොනිබීම	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් වලින් 40% ක් පමණ මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර, ඉතිරි කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන්ද විශේෂ අවධානයක් යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොනිබීම.	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරමි.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොනිබීම	2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා 2022.01.17 දින වනජීවී රැකවරණය,අලිවැට හා අගල් ඉදි කිරීම් ඇතුලු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඉන් පසු වර්ෂවල කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර ඇති අතර මෙම වර්ෂයේදී නියමිත දිනට ලබා දීමට කටයුතු කරමි.
දෙවැනි කොටස : 65.00	
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොනිබීම.	මේ වන විට ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර,ඒ තුළින් මහජනයාට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා දීමට කටයුතු කරමි.එතෙක් දෙපාර්තමේන්තු සම්බන්ධීකරණ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර, හදිසි ඇමතුම් ලබා දීම සඳහා 1992 හදිසි ඇමතුම් අංශය පැය 24 පුරාම ක්‍රියාත්මක වේ.
2018 අප්‍රියෙල් 27 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයින් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොනිබීම	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් දෙදෙනෙකු නම්කර යැවීමට කටයුතු කර ඇත.

පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම.	වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඍජුවම මහජනතාව සමඟ සම්බන්ධව කටයුතු කරන්නේ සංචාරක බංගලා වෙන් කිරීම සම්බන්ධව පමණක් වන අතර, එයද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කර ගත හැකි බැවින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුනු බව දන්වමි. නමුත් මේ වනවිට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කරමින් පවතී.
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම	2020 වර්ෂයේ රට තුළ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් එම වර්ෂයේ මාර්තු සිට වරින් වර ඇදිරිනීතිය පැනවීම සහ සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලය රාජකාරී සඳහා කැඳවීම අත්‍යවශ්‍ය රාජකාරී කටයුතු සඳහාත් කණ්ඩායම් වශයෙනුත් සිදු කරන ලදී. එවැනි පසුබිමක් මත කණ්ඩායම් වශයෙන් නිලධාරීන් රැස් කිරීමට නොහැකි වූ බැවින් 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ගැටළු සහගත විය. එහෙත් සියළුම පුහුණු වැඩ සටහන් අධ්‍යක්ෂ (මෙහෙයුම්) ගේ ඍජු අධීක්ෂණය යටතේ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා පුහුණු) විසින් සැලසුම්ගත ක්‍රියාත්මක සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට හැකිවූ වාර්ෂික පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.මේ වන විට මානව සම්පත් සංවර්ධන සැලැස්මෙහි පළමු කෙටුම්පත පිළියෙල කර ඇත. 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් නිරෝධායන ඇදිරිනීතිය වරින් ක්‍රියාත්මක වීම නිසා එවකට නිකුත් කර තිබූ සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව කණ්ඩායම් ලෙස නිලධාරීන් රැස් කිරීමේ අපහසුතාවය හේතුවෙන් 2020 වර්ෂය සඳහා සැලසුම්ගතව ක්‍රියාත්මක කිරීමට තිබූ පුහුණු වැඩසටහන් සියල්ලම පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ක පමණ මට්ටමක පවත්වා ඇත.නැවත යථා තත්ත්වයට පත් වීමෙන් පසුව පුහුණුවීම් කටයුතු නියමිත පරිදි සිදු කරමින් පවතී
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබීම.	
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ඡ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබීම.	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී නිබූ පුහුණු අවස්ථා වලින් ලබා දී පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම.	

ආර්.එම්.සී.එම්.හේරත්
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය

එම්. ජී. සී. සූරියබණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ලංකා. 811/ඒ. ජයන්තිපුර පාර.
බත්තරමුල්ල.

එම්.ජී.සී.සූරියබණ්ඩාර
ගණන් දීමේ නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව